
## 2024 ජනවාරි මාසයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් නිෂ්පාදන සහ සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි

**නිෂ්පාදන ක්‍රියාකාරකම්වල වර්ධනයක් පිළිබිඹු කරමින්, නිෂ්පාදන අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය 2024 ජනවාරි මාසයේ දී දර්ශකාංක 55.6ක් වාර්තා කරන ලදී.** මෙම වර්ධනය සඳහා සියලුම උප-දර්ශකයන්ගේ දක්නට ලැබුණු ඉහළ යෑම හේතු විය.

| නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | |
|---|---|
| 2024 ජනවාරි | 55.6 |

නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑම සඳහා රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශය ප්‍රධාන වශයෙන් දායක විය. එසේ වුවද, ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයේ නව ඇණවුම් සහ නිෂ්පාදන පෙර මාසයට සාපේක්ෂව අඩු වූ අතර, ඒ සඳහා දෙසැම්බර් උත්සව සමයෙන් පසු ඉල්ලුම අඩු වීම හේතු විය. මේ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යෑමට සමගාමීව සේවා නියුක්තිය සහ තොග මිලදී ගැනුම් ද ඉහළ යන ලදී. තවද, ප්‍රධාන වශයෙන් රතු මුහුදේ නැව් ගමනාගමනයට සිදු වූ බාධා හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ජනවාරි මාසයේ දී වැඩි වේගයකින් ඉහළ යන ලදී.



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | දෙසැ. 2023 | ජන. 2024 | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 52.7 | 55.6 | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| නව ඇණවුම් | 56.0 | 55.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 53.0 | 54.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 42.5 | 55.1 | + | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 59.5 | 55.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 54.5 | 58.2 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වූ අපේක්ෂාවන් ඉහළ මට්ටමක පවතින අතර, සාර්ව ආර්ථික වාතාවරණය ක්‍රමයෙන් යහපත් වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

### ගෝලීය ප්‍රවණතා
### නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | පහත වැටීමක සිට කඩ ඉම් මට්ටමට ළඟා වීමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | සමාන වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | පහත වැටීමක සිට ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| යුරෝපා කලාපය | අඩු වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 පෙබරවාරි 15 වන දිනට ([PMI Releases (spglobal.com)](spglobal.com))*

*[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ලෙස හඳුන්වනු ලබන ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය[2] 2024 ජනවාරි මාසයේ දී දර්ශකාංක 60.1ක් වාර්තා කළ අතර, එමගින් සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කළේය.**

ව්‍යාපාර ක්‍රියාකාරකම් තවදුරටත් වර්ධනය වීම සඳහා අඛණ්ඩව දෙවන මාසයටත් සංචාරක පැමිණීම් 200,000 ඉක්මවීම මධ්‍යයේ අනෙකුත් පෞද්ගලික සේවා කටයුතු සහ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා යන උප අංශවල දක්නට ලැබුණු සැලකිය යුතු ප්‍රගතිය හේතු විය. මේ අතර, වෙළෙඳපොළ පොලී අනුපාත අඩු වීමට සමගාමීව මූල්‍ය සේවා ද තවදුරටත් වර්ධනය විය. කෙසේ වෙතත්, එකතු කළ අගය මත බදු සඳහා වන සංශෝධන සහ උත්සව සමය අවසන් වීම තොග සහ සිල්ලර වෙළඳාම උප අංශයට අහිතකර ලෙස බලපෑවේය.

සේවා අංශයේ නව ව්‍යාපාර පිළිබඳව සලකා බැලීමේ දී, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා කටයුතු සහ වෘත්තීය සේවා යන උප අංශවල දක්නට ලැබුණු ඉහළ යෑම් සමඟ ජනවාරි මාසයේ දී නව ව්‍යාපාර ඉහළ ගියේය.

සමාගම් කිහිපයක නව බඳවා ගැනීම් සිදු කළ නමුත් සේවා නියුක්තිය ජනවාරි මාසයේ දී පහළ ගියේය. මේ අතර, නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | දෙසැ. 2023 | ජන. 2024 | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** (**ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය**) | **71.0** | **60.1** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| නව ව්‍යාපාර | 64.5 | 54.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 46.5 | 48.5 | + | අඩු වේගයකින් පහත වැටීමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 48.3 | 46.7 | - | වැඩි වේගයකින් පහත වැටීමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 64.1 | 69.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ජනවාරි මාසයේ දී අඛණ්ඩව ඉහළ ගියේය. කෙසේ වෙතත්, එකතු කළ අගය මත බදු සඳහා වන සංශෝධන හේතුවෙන් පාරිභෝගිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවීමට සමගාමීව විකුණුම් පහත වැටීම සහ යෙදවුම් පිරිවැය වැඩිවීම පිළිබඳ ප්‍රතිචාර දක්වන්නන් අවධාරණය කර ඇත.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)** **60.1**

**2024 ජනවාරි**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
(ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය)




**ගෝලීය ප්‍රවණතා**

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| ගෝලීය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඉන්දියාව | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| චීනය | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් ජනපදය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| යුරෝපා කලාපය | වැඩි වේගයකින් පහත වැටීමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 පෙබරවාරි 15 වන දිනට (PMI Releases (spglobal.com))*

[2] පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, 2024 ජනවාරි සිට ''සේවා අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය'', ''සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය'' ලෙස හඳුන්වනු ලැබේ.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

ප්‍රශ්නාවලිය ඊළඟ මාසයේ පළමු භාගයේ දී සම්පූර්ණ කෙරේ. සෑම විචල්‍යයක් සඳහාම, පෙර මාසය හා සසඳන විට වැඩි වීමක්, අඩුවීමක් හෝ නොවෙනස්ව පැවතීමක් ද යන්න වාර්තා කිරීමට ප්‍රතිචාර දක්වන්නන්ගෙන් ඉල්ලා සිටින අතර, යම් වෙනසක් සඳහා හේතු දැක්වීමට ඉල්ලා සිටිනු ලැබේ. දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** නිෂ්පාදන ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස සැලකෙන අතර, නව ඇණවුම්, නිෂ්පාදන, සේවා නියුක්තිය, තොග මිලදී ගැනුම් සහ ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප-දර්ශකයන්ගේ භරිත සාමාන්‍යයකි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සේවා ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.